# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

India's National Spiritual Newspaper

₹ 10/-

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII | MARCH 2024 | Issue No. 04


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 31:17 - 24)

17. මම ලජ්ජා නොවෙම්වා; මක්නිසාද ඔබට හඬගැසීමි. දුෂ්ටයෝ ලජ්ජාවෙත්වා, ෂෙයෝලෙහි හෙවත්, පාතාලයෙහි. නිශ්ශබ්දවෙත්වා.

18. ආඩම්බරයෙන් හා හෙළාදැක්මෙන් ධර්මිෂ්ඨයාට විරුද්ධව උඩඟු ලෙස කථා කරන්නාවූ බොරුකියන තොල් නිශ්ශබ්දවේවා.

19. ඔබ කෙරෙහි භය ඇත්තන්ට නිධාන කොට තැබූවාවූ, ඔබ කෙරෙහි විශ්වාසය තබන්නන්ට මනුෂ්‍ය පුත්‍රයන් ඉදිරියෙහි ඔබ කළාවූ ඔබගේ යහපත්කම කොපමණ මහත්ද!

20. මනුෂ්‍යයාගේ කුමන්ත්‍රණවලින් ඔබ හමුයෙහිවූ අප්‍රකාශස්ථානයෙහි ඔබ ඔවුන් සඟවනසේක. මුඛ විවාදයෙන් ඔවුන් විමානයෙක්හි රහස්ලෙස ආරක්ෂාකරනසේක.

21. ස්වාමීන්ට ප්‍රශංසාවේවා; මක්නිසාද උන්වහන්සේ ශක්තිමත් නුවරදී තමන් පුදුමවූ කරුණා ගුණය මට පෙන්වූසේක.

22. මම වනාහි: ඔබගේ ඇස් හමුයෙන් සිඳිනු ලබමියි ඉක්මන්කමින් කීයෙමි. එහෙත් මා ඔබට මොරගැසූ කල ඔබ මාගේ කන්නලව් ශබ්දය ඇසූසේක.

23. ස්වාමීන්ගේ සියලු ශුද්ධවන්තයෙනි, උන්වහන්සේට ප්‍රේමකරව්. ස්වාමීන් වහන්සේ විශ්වාස ඇත්තන් ආරක්ෂා කරනසේක, උඩඟු ලෙස ක්‍රියාකරන්නාට බොහෝසෙයින් ප්‍රතිඵල දෙනසේක.

24. ස්වාමීන් කෙරෙහි බලා සිටින සියල්ලෙනි, ශක්තිමත් වව්; තොපගේ සිත ධෛර්යවත් වේවා

## දෙවියන්වහන්සේගේ නිශ්චිතභාවය සමග අවිනිශ්චිත කාලයන් !

(දේවගැති ඒන්ජල් සෙල්වකුමාරි)



## UNCERTAIN TIMES WITH THE CERTAINTY OF GOD!

*"පුදුම දේ කරන දෙවියන්වහන්සේ නම් ඔබය. ඔබ මනුෂ්‍ය වර්ගයන් අතරේ ඔබගේ ශක්තිය දැක්වූසේක." (ගීතාවලිය 77:14)*

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නාමයෙන් ඔබ සැමදෙනාටම ආසිරි පතමි!

මෙම සඟරාව තුළින් නැවත වතාවක් ඔබව මුණගැසීමට ලැබීම ගැන මා ඉතා සතුටට පත්වෙමි. 2024 වර්ෂයේ මාස 2ක් දැනටමත් අපි සම්පූර්ණ කරමින් පැමිණියෙමු. කාලය ඉතා වේගයෙන් ගමන් කරයි. ගීතාවලිය 77 වන පරිච්ඡේදය දෙස බලන විටදී අපට දැකීමට ඇති කාරණය නම්, අප විශ්වාස කරන්නාවූ දෙවියන්වහන්සේ ඉතා මහත් වූ දේ කරන බවයි. උන්වහන්සේගේ බලය උන්වහන්සේගේ සෙනඟ අතරෙහි ක්‍රියාත්මක කිරීමට දෙවියන්වහන්සේට ප්‍රිය වෙයි. කල නොහැකි වූ දේ කිරීමට උන්වහන්සේ ඉතා ඕනෑකමින් ඉල්ලා සිටී. උන්වහන්සේ තුළ අපගේ නොසැලෙන්නාවූ ඇදහිල්ල තබාගෙන මේ ගමන අප ගමන් කරනු දැකීමට උන්වහන්සේ ප්‍රිය වෙති.

අපගේ ජීවිත ගමනේදී බොහෝ බාධාවන්, රළුතැන්, අඳුරු ස්ථානයන්, ප්‍රපාතයන්, කඳු සහ මිටියාවත් වැඩි වැඩියෙන් පැමිණෙමින් අපගේ ජීවිතයට

3 වෙනි පිටුවට ...




Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!

English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

REACHING NATIONS



*from your dearly beloved brother...*

# කැඳවීමේ ප්‍රතිරාවය



**"ආශ්චර්ය කිරීමේ එකම කර්තෘවූ ඉශ්‍රායෙල්ගේ දෙවි වූ ස්වාමී වූ දෙවියන්වහන්සේට ප්‍රශංසා වේවා' (ගීතාවලිය 72:8)**

**යේසුස් වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි,**

පසුගිය මාස කීපයක් තුලදී ස්වාමීන්වහන්සේ අපගේ සේවාවන් වලට පුදුමකාර ලෙස ආශිර්වාද කලේය. උන්වහන්සේගේ අනර්ඝ පණිවිඩය තුළින් ඉතා දුර ප්‍රදේශවල ජීවත්ව සිටින අයට පවා දෙවියන්වහන්සේ ආශිර්වාද කර තිබේ. කැඳවීමේ ප්‍රතිරාවය මාස්පතා සඟරාව YouTube හරහා විකාශනය වන හෙයින් බොහෝ අය මෙම සේවය තුළින් ආශිර්වාද ලබා ඇති නිසා දෙවියන්වහන්සේට ස්තුති කරමි. 2023 වර්ෂයේ දෙසැම්බර් 31 වන දින පැවැත්වූ අලුත් අවුරුදු දේව මෙහෙය දෙවියන්වහන්සේ මහත් සේ ආශිර්වාද කලේය.



*Watch Night New Year Service*



*Pr P. Arokiadas with Senior Pastor*

අපගේ නෙහෙමියා විදුහලෙන් උපාධිය ලබාගත් පාස්ටර් P. ආරොගයදාසන් දැන් වලාසරවාකසම් යන ස්ථානයෙහි සේවය කරන අතර ඔහු අපගේ ප්‍රධාන සභාවට පැමිණ ඔහුගේ බලවත් සාක්ෂිය බෙදාගත්තේය. ඔහුගේ අලුත් සේවාව මෙම ප්‍රදේශයෙහි ආරම්භ කර ඇත.

සහෝදර සුරේෂ් සහ ඔහුගේ පුතා වන අවිනාශ් යන දෙදෙනා චෙටිස්ගර් ප්‍රාන්තයේ ඇති අපගේ ප්‍රධාන සභාවට පැමිණ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය මහිමයට පත් කරමින් අපගේ කැඳවීමේ ප්‍රතිරාවය හිංදි භාෂාවෙන් ඔහු ලබාගත් ආශිර්වාදයන් මොනවාද කියා බෙදාගත්තේය.



*Bro. Suresh Tirge and his son Avinash Tirge with Senior Pastor*

## OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.
MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.
GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.
ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)
EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Sis. L. Mariya Anjalin, M.A., M.Sc., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858
95661 31858
E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in
WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com
YOUTUBE CHANNEL
Echo of His Call

අපගේ සභාව තුළ සේවය කරන්නාවූ සියලු දෙනා උදෙසා යාච්ඤා කරන්න.

නෙහෙමියා විදුහලේ ශිෂ්‍යයින්ටත් සභාවේ තරුණ නායකයින්ටත් ජනවාරි මස 24 වන දින මහවැලිපුරම් හි අපි පැවැත්වූ එක්දින වැඩසටහනට 60 කට වඩා වැඩි පිරිසක් සහභාගී විය. එය ඉතාම ආශිර්වාදමත් කාලයකි.

නෙහෙමියා විදුහලට දිගුකාලීන සැලැස්මක් දෙවියන්වහන්සේ අපට දී තිබේ. හිංදි භාෂාවෙන් ඉගෙන ගන්නාවූ ශිෂ්‍යයින් මේ පලාතේ එනම්, උතුරු ඉන්දියාවෙන් පැමිණ සේවය කරන අයට බලවත් සේවයක් කරති. මේ සේවය නිසා නීතිඥ ධර්මරාජ්, පාස්ටර් ෆ්‍රැන්ක්ලින්, හා පාස්ටර් දේවදාස් ඉතා උනන්දුවෙන් උතුරු ඉන්දියාවෙන් පැමිණ අපට සේවය කරමින් සිටී.





*One day retreat held at Mahabalipuram*

කරුණාකර සියලු සේවකයින් උදෙසාත් විවිධාකාර අන්දමින් අප පවත්වාගෙන යන්නාවූ කැඳවීමේ ප්‍රතිරාවය සේවය ගැනත් යාච්ඤා කරන්න. ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක්වා.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ සේවක**

*Pr. Alex Samson Sam*
*Pr. S. Sam Selva Raj*

(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

## Kind Attention: Echo of His Call Readers

Our 5 minute **Echo of His Call** YouTube messages are being broadcasted from 2.00 A.M. in Tamil, Telugu, English and Hindi (everyday). You can receive the Grace of God by watching the messages.

Moreover, save my mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (personal) in your mobile phones.

- Pr. S. Sam Selva Raj

*....Contd. from page 1*

අවිනිශ්චිතභාවයක් ගෙන දෙයි. අප නොදැන ගමන් කරන්නාවූ මාර්ගය තුල නිතරම අපට නොයෙකුත් වෙනස්වීම් හා අභියෝගයන් පැමිණෙනු ඇත.

මා මගේ වාහනය පදවාගෙන යන විටදී නිතරම මාර්ගය පෙන්වන සිතියම පාවිච්චි කරමි. එවිට මා යා යුතු ස්ථානය ස්ථිර කර ගැනීමටත් කිසිම බාධාවකින් තොරව ගමන් කිරීමටත් හා ඉතාම වැදගත් වූ කාරණය නම්, එම මාර්ගයෙහි ඉදිරියේ ඇති තත්ත්වය කෙසේද කියා දැනගැනීමටත් හැකිවෙයි. මන්ද මා කඳුකර වූ ප්‍රදේශයක ජීවත් වන හෙයින් බොහෝ කඳු හා පල්ලම් තිබෙන නිසා Google මාර්ග සිතියම පාවිච්චි කරන නිසා මා යා යුතු ස්ථානයට ඉතා පරිස්සමින් යාමටත් මා ගමන්කරන්නාවූ ඉදිරි මාර්ගය කෙසේද කියාත් මඟ පෙන්වයි. තවද මා වාහනය ඉස්සර කල යුත්තේ කුමන ස්ථානයෙන්ද? සෙමින් වාහනය පැදවිය යුත්තේ කුමන ස්ථානයෙන්ද? කියා මඟපෙන්වනු ඇත. එසේම ඉදිරියෙන් ඇති අනතුරුදායක වංගු මොනවාද කියා දැනගත් විටදී ඉතා පරිස්සමෙන් නොදන්නාවූ මාර්ගයෙහි ගමන් කිරීමට හැකිය. GPS නිසා මා ඉදිරියේ අවිනිශ්චිත මාර්ගයන් තිබුණත් එම මාර්ගයන්හි ආරම්භය හා අවසානය GPS තුළින් මා හට දැකගැනීමට හැකියාව ඇත.

මා ඔබ ගැන නොදනිමි. නමුත් මා කිසියම් ගමනක් පටන්ගැනීමට පෙර එහා අවසානය දැනගැනීමට කැමැත්තෙමි. මා යන්නේ කොහාටද? කියාත්, මා ගමන් කරන්නාවූ ගමනෙහි කොතරම් අමාරුකම් තිබේද? කියාත් මා මුලින්ම දැනගැනීමට කැමැත්තෙමි. නමුත් අපගේ ජීවිත ගමන එසේ වන්නේ නැත. අපගේ ජීවිත ගමන තුල අප බලාපොරොත්තු නොවන්නාවූ අභියෝග, කිසියම් පාඩු අප ප්‍රේම කරන්නාවූ අයගෙන් වෙන්වීම, රැකියාවේ වෙනස් වීම්, මූල්‍යමය අපහසුතාවයන් හා බලාපොරොත්තු නොවූ කුණාටු අපගේ සම්බනධතාවයන් තුළට ඇතුල් වෙනු ඇත.

මෙවැනි අවිනිශ්චිතභාවයන්ගෙන් අප ජයගන්නේ කෙසේද? මගේ ජීවිතයේ මට හමුවුණාවූ එක් යුවලක් ගැන මට මතක්වෙයි. ඔවුන් විවාහ වී වසර 27 ක් පසුවිය. ඔවුන් දෙදෙනා හට ඉතාම ලස්සන දරුවන් 3 දෙනෙක් සිටියෝය. ඔවුන් ඉතා ප්‍රේමණීය එකිනෙකා තේරුම්ගැනීමට හැකිවූ යුවලක්ව සිටියේය. ඔවුන් දෙනොම වෙන්වීමට යන්නේය කියා මට එක් දිනකදී ආරංචි විය. එය මා පුදුමයට පත්කලාවූ කාරණයකි. මේ පිළිබඳව මා එම භාර්තවගෙන් ඇසූ විට ඇය පවසනු ලැබූයේ, ''මෙය මගේ ජීවිතයෙහි බලාපොරොත්තු නොවූ දෙයකි. මගේ ජීවිතයෙහි කිසි දවසක මෙවැනි දෙයක් මා බලාපොරොත්තු වූයේ නැත.'' කියාය.

මෙය ඉතාම අමාරු හා වේදනාකාරී සිදුවීමකි. නමුත් සත්‍ය ඒ ආකාරයෙන්ම පවතියි. මේ සෑම දෙයක් තුළින්ම එක් දෙයක් සහතිකයි. එනම්, දෙවියන්වහන්සේ ඉතාම විශ්වාසවන්තයි෴ අපගේ ජීවිතයේ භය, වේදනාව, දුක, පරාජය, ප්‍රීතිය, සතුට යන මේ සෑම දේ මධ්‍යයේම දෙවියන්වහන්සේ විශ්වාසවන්තයි.

***දෙවියන්වහන්සේගේ වචනයෙහි මෙසේ පවසයි. ''පුදුම දේ කරන දෙවියන්වහන්සේ නම් ඔබය. ඔබ මනුෂ්‍ය වර්ගයන් අතරේ ඔබගේ ශක්තිය දැක්වූ සේක.'' (ගීතාවලිය 77:14)*** මෙය සෑම අවස්ථාවකටම ගැලපෙන්නේය.

මෙවැනි අවිනිශ්චිත කාලයේදී පුද්ගලිකවත් සභාවක් හැටියටත් දෙවියන්වහන්සේ අපගේ පවුල් වලටත් සභාවටත් කුමක් කරන්න යනවාද කියා අප දැනගැනීමට අවශ්‍ය වෙයි.

මේ සෑම දේටම වඩා තිබෙන්නාවූ ලොකුම ප්‍රශ්නය නම්, මෙවැනි දුක්බර සෑම අවස්ථාවකදීම දෙවියන්වහන්සේ කොහෙද? මෙය ඉතාම පොදු සහ භයානකවූ ප්‍රශ්නයකි.

දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයින් බොහෝ කාරණාවන් නිසා හිරවී යා යුතු මාර්ගය කොහේද කියා නොදැන තමාගේ අනාගතය ගැන ස්ථිරවභාවයක් නැතිව අවිනිශ්චිතවූ කාලයක් තුළ ගමන් කරන විටදී උන්වහන්සේ පුදුම දේ කරන බව දේව වචනය අපට උගන්වයි. අප අතරින් කී දෙනෙක් මෙවැනි වූ අවිනිශ්චිත කාලයක් ගමන්කරනාවද? කියා මා නොදනිමි. එසේම, මගේ ජීවිතය කවදා වෙනස් වෙයිද? කියා අප අසනවා ඇත. ඔබගේ ජීවිතයේද ඔබ ඉතා අභියෝගමත් අවිනිශ්චිත වූ කාලයක ගමන් කරන විටදී උන්වහන්සේ තවමත් සිංහාසනයෙහි සිටිමින් රජකරනවා ඇත. සමහර වෙලාවට උන්වහන්සේ අපගේ ජීවිත වලත් මෙවැනි වූ දේ සිදුවීමට ඉඩදී බලා සිටින්නේ, එවැනි අවස්ථාවන් වලදී අප උන්වහන්සේ දෙස බලන පිණිසයි. උන්වහන්සේ ඔබගේ සියලුම අමාරු අවස්ථාවන් වලදීත්, අවිනිශ්තචි භාවයේදීත් ඔබව ඔසවන බව විශ්වාස කරන්න.

ඉශ්‍රායෙල්වරුන්ගේ ජීවිතය හැර අපට වෙන හොඳ උදාහරණයක් නොමැත. ඔවුන්ගේ වහල්කමින් ඔවුන්ව මුදවාගන්නා පිණිස වසර 400 ක කාලයක් ඔවුන් යාච්ඤා කලේය. අවසානයේදී උන්වහන්සේගේ බලය මිසරවරුන් ප්‍රකාශ කර පුදුම වූ භාස්කම් කලේය. එනම්, වසංගත, මරණ ඔවුන් අතරට එවුවේය. උන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟ උදෙසා රතු මුහුද දෙබෑ කලේය. මිසර හමුදාව එම රතු මුහුදේම විනාශ විය. දෙවියන්වහන්සේ මිසරය පිටට පැමිණෙවූ වසංගත 10 ම එවනු ලැබූයේ උන්වහන්සේගේ බලය ප්‍රකාශ කරන පිණිසයි. දෙවියන්වහන්සේට ඉශ්‍රායෙල් සෙනඟව ක්ෂණිකවම පිටතට ගෙන ඒමට හැකියාව තිබූ නමුත් උන්වහන්සේ මේ සියල්ලම කරනු ලැබූයේ, යෙහෝවා දෙවියන්වහන්සේ කවුද? කියා මිනිසුන්ට පෙන්වන පිණිසත් උන්වහන්සේගේ බලයත් උන්වහන්සේ කවුද කියා ප්‍රකාශ කරන පිණිසත්ය. එසේ නම්, 2024 වන වසරේදීත් ඔබට අවිනිශ්චිත කාලයක් තිබෙන්නේ දෙවියන්වහන්සේව විශ්වාස කරන පිණිසයි.

**අපගේ ජීවිතයෙහි අවිනිශ්චිත කාලයත් සමඟ ක්‍රියා කරන්නේ කෙසේද?**

අපගේ ජීවිතයෙහි අවිනිශ්චිත කාලයන් පැමිණෙන විට අපට ඇති වන හැඟීම සහ අත්දැකීම නම්, කැළඹීම, සැකය, ප්‍රශ්න කිරීම, භය, වේදනාවන්, අප මුහුණ දෙන්නාවූ විවිධ තත්ත්වයන් නිසා අන් අයට දොස් පැවරීම, කෝපය, එපා වීම, තිත්තකම, අධෛර්‍යවීම්, බලාපොරොත්තු සුන්වීම, දුක, තනිකම, කනසල්ල හා සාංකාව යන මෙවැනි දේ නොකඩවාම සිදුවන විටදී අප කුමක් කල යුතුද? සෑමදේම නතරකර දමමුද? එසේ නොමැතිනම් සෑම දේම දරාගෙන ඉදිරියට යනවාද?

මෙවැනි අවිනිශ්චිත කාලයන් පැමිණෙන විට අප කුමක් කල යුතුද?

**(1). දෙවියන්වහන්සේ අපගේ ආනගතය ගැන දන්නා නිසා උන්වහන්සේගේ පොරොන්දුව තදින්ම අල්ලා ගන්න!!!**

ඔබ නොදන්නාවූ ඔබගේ අනාගතය ඔබ ගැන දන්නාවූ දෙවියන්වහන්සේගේ දෑතට බාර කරන්න.

කිසිම මනුෂ්‍යයෙකුගේ අදහස් ලබා නොගෙන දෙවියන්වහන්සේට ඇලුම් වෙමින්, ඔබ ඔබගේ ජීවිතයේ

*....Contd. to page 6*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

බෙදා ගැනීම (ගලාති 6:2)
උපකාර කිරීම (රෝම 12:13) සහ
පුබුදු කිරීම (2 තිමෝති 1:6)

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**මාර්:19**- කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ දේවධර්ම පාඨමාලාව ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:20**- නෙහෙමියා බයිබල් විදුහලේ සහ කැඳවීමේ ප්‍රතිරාවය දේවසභාවේ සිසුන් විසින් ජනවාරි 26 පැවැත්වූ වැඩසටහන ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:21**- පාස්ටර් සැම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු බලවේග වලින් ආරක්ෂා කිරීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:22**- මාර්තු 22 වර්ෂ 1969 සිට පැවත එන කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:23**- කැඳවීමේ ප්‍රතිරාවය නිර්මාතෘ පාලක සැම් සෙල්වරාජ්ගේ කැපවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:24**- යාච්ඤා සේවය, ඇදහිල්ලේ සේවය මහා නියෝගය ඇතුළු සැම සේවයකටම සම්බන්ධ සහායකයන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:25**- නවක ඇදහිලිවතුන් සභාවට ලැබීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:26**- නෙහෙමියා බයිබල් විදුහල ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:27**- කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සියලුම සහකාර කතෘවරුන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:28**- කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ ළමා හා තරුණ සේවයට සම්බන්ධ ක්‍රියාකාරකම් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:29**- ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලට කිතුණු ගුරුවරුන් ලැබීම ගැන ස්තුති කරන්න

**මාර්:30-** ශාඛා සභා සේවයේ වර්ධනය ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**මාර්:31**- කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සම්බන්ධීකාරක වරුන් ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**අප්‍රේ:01**- දේව සේවයේ අවශ්‍යතා ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**අප්‍රේ:02**- දේශපාලන සහ ආර්ථික ගැටළු වලින් කිතුණු සේවා වලට බාධා නොවීම ගැන ස්තුති ප්‍රශංසා කරන්න

**අප්‍රේ:03**- යුධ ගැටුම් වලට මුහුණ දී සිටින රටවල ජනතාවට සහනය ලැබෙන පිනිස ස්තුති ප්‍රශංසා කරන්න

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**අප්‍රේ:04**- දේව රාජ්‍යය ගොඩනැගීමට අවශ්‍ය සැලසුම් දෙවිඳුන්ගෙන් ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**අප්‍රේ:05**- පැතිර යන උණ වසංගතය ගැන යාච්ඤා කරන්න

**අප්‍රේ:06**- හැකි හැම ආකාරයෙන් දේව සේවයට අදාළ දේ වර්ධනය වීම ගැන යාච්ඤා කරන්න

**අප්‍රේ:07**- දේශපාලන නායකයින් ගැන යාච්ඤා කරන්න

**අප්‍රේ:08**- යාච්ඤාවෙන් සහ උපකාර කිරීමෙන් දේව සේවයට කැපවෙන අය ගැන යාච්ඤා කරන්න

**අප්‍රේ:09**- කැඳවීමේ ප්‍රතිරාවය සහකාර කතෘවරුන් ගැන යාච්ඤා කරන්න

**අප්‍රේ:10**- ලෝකයේ සැම දරුවන් සහ තරුණ තරුණියන් යේසුස් වහන්සේ තම ගැළවුම් කරු ලෙස පිලිගන්නා පිනිස යාච්ඤා කරන්න

**අප්‍රේ:11-** සැම රටකම පුරවැසියන් එක්සත්ව සිටින පිනිස යාච්ඤා කරන්න

**අප්‍රේ:12-** යාච්ඤා සේවය, ඇදහිල්ලේ සේවය මහා නියෝගය ඇතුළු සැම සේවයකටම සම්බන්ධ සහායකයන් ගැන යාච්ඤා කරන්න

**අප්‍රේ:13-** කපරිසංණක මෘදුකාංගය තුළ නෙහෙමියා බයිබල් විදුහලේ දත්ත සුරක්ෂිත වීම ගැන යාච්ඤා කරන්න

**අප්‍රේ:14-** අසරණ වී සිටින ජනතාවට සහන ලැබෙන පිනිස යාච්ඤා කරන්න

**අප්‍රේ:15-**දේව සේවය සඳහා අවශ්‍ය මුල්‍යමය අවශ්‍යතා ගැන යාච්ඤා කරන්න

**අප්‍රේ:16-** ලෝකයේ සැම රටක්ම මුහුණ දෙන ආර්ථික අවපාතය අවම වන පිනිස යාච්ඤා කරන්න

**අප්‍රේ:17-** ශුද්ධාත්ම ආලේපය නැවත වරක් දේව ජනතාව ස්පර්ශ කරන පිනිස යාච්ඤා කරන්න

**අප්‍රේ:18-** පාස්ටර් සැම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අය නපුරු බලවේග වලින් ආරක්ෂා කරන පිනිස යාච්ඤා කරන්න

....Contd. from page 4

අවස්ථාවන් සැලසුම් කරන විටදීත් ඒවා ආරම්භ කරන විටදීත් ස්වාමීන්වහන්සේගෙන් මඟපෙන්වීම ලබාගෙන ආරම්භ කරන්න. අලුතෙන්ම යමක් කිරීමට පෙර දෙවියන්වහන්සේගේ වචනයෙන් ඒ සම්බන්ධව ස්ථිරත්වයක් ලබා ගන්න.

ඔබගේ ජීවිතයෙහි අවිනිශ්චිත වූ කාරණාවලට මුහුණ දෙන විටදී ඔබට නැවත හැරෙන පිණිස දෙවියන්වහන්සේගේ පොරොන්දුව ඔබ හා සමඟ තිබේ. එම පොරොන්දුව ඔබ අත්පත් කරගෙන ඒ තුළ ඔබගේ බලාපොරොත්තුව තබා ගන්න.

අද ඔබගේ බලාපොරොත්තුව කොහේද? අද අපගේ බලාපොරොත්තුව කුමක්ද? අපගේ රැකියාව අපගේ ආරක්ෂක ස්ථානයද? එවැනි රැකියාවක් හෙට ඔබට අහිමි වුවහොත් ඔබට මේ ආකාරයෙන් ප්‍රකාශ කිරීමට පුළුවන්ද? ''මට කිසිම හිඟයක් නැත. මාගේ ස්වාමීන්වහ්සේ මගේ සියලු අවශ්‍යතාවයන් සපයන සේක. දෙවියන්වහන්සේගේ යහපත්කමෙන් හා කරුණාවෙන් මාව තෘප්තියට පත්කරන සේක.''

ඔබගේ ජීවිතයෙහි අවිනිශ්චිතභාවයක් තිබෙන විටදී ඔබගේ අනාගතය දන්නාවූ ස්වාමීන්වහන්සේගේ අභිමුඛත්වයට ගොස් ඔබගේ අවශ්‍යතාවයන් ඉල්ලන්න. මන්ද ස්වාමීන්වහන්සේ ඔබට විශ්වාසවන්තව සිටී. අපගේ හෙට දවසේ හා අප පසුකලාවූ ඊයේ දවසේ සියලු කාරණාවන් සිදු වන්නේ හා සිදු වූයේ දෙවියන්වහන්සේගේ වචනයට අනුකූලවය.

***නික්මයාම 4:2 හි*** දෙවියන්වහන්සේ මෝසෙස්ගෙන් මෙසේ අසයි. ***''...නුඹේ අතේ තිබෙන්නේ මොකක්ද?'' එවිට ඔහු පිළිතුරු දෙමින් ''සැරයටියක්ය'' කියා පැවසීය.*** මෝසෙස් එම පැරණි ලී වලින් සෑදූ සැරයටිය දෙවියන්වහන්සේගේ හස්තයට දීමට තීරණය කල විටදී හාස්කමක් සිදු විය. ඔහුගේ අතෙහි තිබූ සැරයටිය දෙවියන්වහන්සේගේ සැරයටිය විය.

***''මෝසෙස් යෝෂුවාට කතාකොට, නුඹ අපට මිනිසුන් තෝරාගෙන පිටත්ව ගොස් අමලෙක්වරුන් සමඟ සටන් කරපන්න. හෙට මම දෙවියන්වහන්සේගේ සැරයටිය අතින් ගෙන හෙළ මුදුනේ සිටින්නෙමියි, කීවේය.''*** ස්වාමීන්වහන්සේගේ සැරයටිය කරණකොටගෙන ඔහුට යුද්ධයෙන් ජය ගැනීමට හැකි විය.

මෝසෙස්ගේ ජීවිත කථාව දෙස බලන විටදී ඔහුට මිසරයට යන්නය කියා පැවසූ විටදී ඔහු ඒ සඳහා බොහෝ සමාවට කරුණු පවසනු ලැබීය.

අවිනිශ්චිතභාවය නිතරම සමාවට කරුණු සොයයි. ඵාරාවෝ ඉදිරිපිටට යාමට ඔහුට භයක් ඇති විය.

ඔහු තුළ සැකය සහ භය තිබූ විටදී මෝසෙස් තමා අතේ තිබූ දෙය දෙවියන්වහන්සේට භාර දුන්නේය. එවිට එම සැරයටිය කරණකොටගෙන පුදුම දෙයක් සිදුවිය. මන්ද දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ක්‍රියාව එතැනින් ආරම්භ කලේය. අප අපගේ සෑමදේම දෙවියන්වහන්සේට කැපකරන විටදී අපගේ අවිනිශ්චිතභාවය තුල ඇති භය සහ සැකය දුරු කර අපට ආශ්චර්යමත් දේ සිදු කරයි.

අද ඔබ ඔබගේ හස්තයෙහි තිබෙන දේ දෙවියන්වහන්සේට භාරදීමට කැමතිද? උන්වහන්සේට පුදුම දේ කිරීමට පුළුවනි. ඔබගේ භය, කනසල්ල, ප්‍රශ්ණ, කැළඹීම, සැකය, කෝපය, අන් අයට දොස් කීම, වර්ථමානයේදී ඔබ ගමන්කරන්නාවූ තත්ත්වය, කල කිරීම, අශුභවාදී සිතුවිලි යන සියල්ලම දෙවියන්වහන්සේගේ හස්තයට භාර දෙන්න.

**සියල්ලම දෙවියන්වහන්සේගේ සැරයටිය වේවා!**

**(2). දෙවියන්වහන්සේගේ සෙනඟ ඔබ හා සමඟ ගමන් කරන පිණිස ඔබ ඔවුන් වෙතට භාර වෙන්න!**

අද අපට සභාවක් හා සභා පවුලක් අවශ්‍ය වන්නේ ඉහත කාරණාව නිසාය. ඔබ ඔබගේ ජීවිතයේ අවිනිශ්චිත කාලයක් තුළ ගමන්කරන විටදී දෙවියන්වහන්සේගේ මිනිසුන් ඔබ හා සමඟ ඇවිදිනවා නම් ඔබ සමඟ ඉන්නවා නම්, එය ඔබට ශක්තියක් වනු ඇත. ඔවුන් ඔබ සමඟ යාච්ඤා කරයි. ඔබ තනියම ගමන් කරන්නාවූ මාර්ගය තුල ඔවුන් ඔබ සමඟ ගමන් කරයි. එබැවින් අපත් සමඟ නිතරම ගමන් කිරීමට හැකි අප සමඟ හිද යාච්ඤා කරන, අපට ආත්මික උපදෙස් දිය හැකි අය සමඟ නිතරම අපගේ ආත්මික සම්බන්ධතාවය තබාගත යුතුය.

ඔබ හා සමඟ නිතරම යාච්ඤා කල හැකි කෙනෙක් අදම තෝරා ගන්න. තමාගේ ආත්මික අත්දැකීම් වලින් ඔබට ආශිර්වාද කල හැකි කෙනෙක්ව තෝරා ගන්න. එවිට ඔබගේ ජීවිතය සාර්ථකත්වයට පත් වෙයි.

දානියෙල්ගේ ජීවිතය දෙස බලන විටදී ඔහු උපන් ස්ථාන, ඔහුගේ ඥාතීන්, මිත්‍රයින්, ඔහුගේ පවුල, ඔහුට තිබූ නිදහස ආදී සියල්ලම අත්හැර ඔහුගේ තරුණ කාලය තුළදීම ඔහු නොදන්නාවූ දේශයකට ගොස් ජීවත් වීමට සිදුවූ කාලයක් තිබුණි.

දානියෙල් 1 වන පරිච්ඡේදය දෙස බලන විටදී ඔහු දෙවියන්වහන්සේ ඉදිරියෙහි දයාව ලබාගත් ආකාරය අපට දැකීමට හැකිය. ඔහුගේ ජීවිතයේ සෑම දේම ඉතා හොඳින් සිදු වූ නමුත් 2 වන පරිච්ඡේදය දෙස බලන විටදී ඔහු ඉතා විශාල ප්‍රශ්නයකට මුහුණ දෙනු ලැබීය.

*"...නෙබුකද්නේශර් ස්වප්න දුටුවේය, එයින් ඔහුගේ ආත්මය කැළඹී ඔහුගේ නින්ද ඔහුගෙන් පහව ගියේය." (දානියෙල් 2:1)*

*"එබැවින් රජ කිපී උදහස් වී, බබිලෝනියේ සියලු ශාස්ත්‍රවන්තයන් මරණ ලෙස නියෝග නිකුත් විය. එහෙයින් ඔව්හු දානියෙල් සහ ඔහුගේ සමාගම්කාරයන් මරන්ට සෙව්වෝය." (දානියෙල් 2:12 - 13)* කියා පවසයි. සෑම දේම ඉතා හොඳින් සිදුවන විටදී ක්ෂණිකවම දානියෙල්ගේ රැකියාව නැතිවන විට ඔහුගේ ජනප්‍රියත්වය හා වගකීම්ද නැතිව ගියේය. ඔහු මේ සියලුම දේ ඉතා වෙහෙස මහන්සියෙන් හා කැපවීමෙව් යුතුව ලබා ගත්තද සෑම දෙයක්ම නිශ්ඵල විය.

ඔහු කලේ මොනවාද? මෙවැනි අවිනිශ්චිත වේලාවේදී ඔහු කලේ කුමක්ද? දානියෙල් 2:17-18 දක්වා පදවල මෙසේ පවසයි. ඔහු තම මිත්‍රයින් සමඟ මෙය බෙදාගෙන යාච්ඤා කලේය. ඔහුත් සමඟ ඇදහිල්ලෙන් යුතුව ඔහුව තේරුම්ගැනීමට හැකි අය සමඟ ඔහු යාච්ඤා කලේය. මේ යාච්ඤාව කරණකොටගෙන සිදුවූයේ මොනවාද කියා අපි දනිමු. දෙවියන්වහන්සේගේ අනාගත සැලසුම් උන්වහන්සේ ඔවුන්ට එළිදරව් කලේය.

**අපගේ දෙවියන්වහන්සේ වික්‍රමාන්විතයි. එබැවින් දේව භය ඇති දෙවියන්වහන්සේගේ මිනිසුන්ව ඔබ වට තබා ගන්න.**

**(3). ඔබ නිශ්චලවී මා දෙවියන්වහන්සේ බව දැනගන්න. (ගීතාවලිය 46:10)**

ජීවිතයේ අවිනිශ්චිතභාවයන් පැමිණෙන විටදී ඔබගේ මනස ක්‍රියාශීලී තත්වයක්ද ප්‍රශ්න විසඳීමේ හැකියාවන් ගැන කලබලකාරී තත්වයක්ද ඇති වෙයි. එම නිසා ඔබට අධික කෝපය හා ආතතියක් ඇති වෙයි.

එම නිසා ඔබගේ හදවත තුල දෙවියන්වහන්සේගේ සත්‍යතාවයන් සම්බන්ධව තිබෙන කාරණාවන් වලට ඔබගේ මනසේ අවධානය යොමු කරන්න අවශ්‍ය වෙයි.

අපගේ නිහඬතාවය කරණකොටගෙන දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය ගැන ඉතා හොඳ අවබෝධයක් ඇති වී ක්‍රියා කිරීමට අපට හැකි වෙයි.

අප කැළඹිලිකාර තත්වයකට පත්වන මොහොතේදී අපට උපකාර පැමිණෙන්නාවූ අහස හා පොළොව සෑදුවාවූ කඳු දෙසට අපගේ දෑත් දිගුකල යුතුය. පොළොව කම්පා කරන්නාවූ මුහුද කළඹන්නාවූ තැනැන්වහන්සේ දොරවල විවෘත කරන අතර තවත් දොරවල් වසා දමයි.

දෙවියන්වහන්සේ අභිමුඛත්වය තුළ නිශ්චලව සිටීමට ඉගෙන ගන්න. ඔබ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට ගොස් කිසිවක් කථා නොකර දෙවියන්වහන්සේ ඉදිරියෙහි නිශ්චලව සිටිමින් උන්වහන්සේ වචනයක් කථා කරන තුරු බලා සිටින්න. ඇදහිල්ලේ කර්තෘවරයාද සම්පූර්ණකරන්නාද වූ ස්වාමීන්වහන්සේ දෙස ඇදහිල්ලෙන් බලා සිටින්න. ***දෙවියන්වහන්සේගේ සටන ඔබගේ අතට නොගන්න.*** ඔබ වෙනුවෙන් දෙවියන්වහන්සේ සටන් කරයි.

ඔබ දෙවියන්වහන්සේගේ අභිමුඛත්වයට යන විටදී,

1). ඔබගේ හැඟීම් කියා සිටින්න. ඔබගේ සීමාවන් පිළිගන්න.

2). ඔබ ළඟ තිබෙන්නාවූ දේ දෙවියන්වහන්සේට දෙන්න. එනම්, සැරයටිය භාර දෙන්න. එය දෙවියන්වහන්සේගේ සැරයටිය විය යුතුයි. දෙවියන්වහන්සේ එම ප්‍රශ්න සමඟ ගනුදෙනු කරන සේක.

10 වෙනි පිටුවට ...

**Statement about ownership and other particulars about the Newspaper Echo of His Call (Sinhala) - Form IV (See Rule 8)**

| | | |
|---|---|---|
| 1. Place of Publication | : | **New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai - 600 005.** |
| 2. Periodicity | : | **Monthly** |
| 3. Printer, Editor, Owner & Publisher | : | **S. Sam Selva Raj** (Same Address) |
| 4. Nationality | : | **Indian** |

I, **S. Sam Selva Raj** hereby declare that the particulars given above are true to the best of my knowledge and belief.

**March 2024** **S. Sam Selva Raj.**

**NEHEMIAH BIBLE**
**RESIDENTIAL / EVENING COLLEGE,**
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
*Registered Candidate for Membership*
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders & Senior Pastors for the past 54 years
**Certificate in Ministry**
**Diploma in Theology**
Qualification : 10th Standard & above
**Rush for admission!**
**Contact : The Chairman, Nehemiah Bible College.**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**"...කියවන්නා තේරුම් ගනීවා...."** (මතෙව් 24:15)

### නුඹ පා තබන්නාවූ දේශය මා නුඹට දෙමි !

**"නුඹලා අඩිය තබන සියලුම ස්ථාන මා නුඹලාට දුනිමි." (යෝෂුවා 1:3)**

1973 වන වසරේදී අප්‍රියෙල් හා මැයි මාසයන් තුළ ඉතා අධික උෂ්ණත්වයක් තිබූ කාල වකවානුවක් වුවත් තරුණ තරුණියන් උදෙසා චෙන්නෙයි තාම්බරම් වල පිහිටි කොරළි උසස් අධ්‍යාපන විදුහලේ සහෝදර R ස්ටැන්ලි විසින්, එනම්, 'ආශිර්වාද තරුණ සේවය' ආරම්භ කලාවූ දාසයා විසින්, එනම් "ආශිර්වාද තරුණ සේවය" ආරම්භ කළාවූ දාසයි විසින් දින 3ක සම්මේලනය සූදානම් කර තිබණි. ඔහු අද දක්වාම ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ඉතා බලවත් සේවයක් කරයි

මමද මේ සම්මේලනයට සහභාගි වූයෙමි. ඒ වන විටදී මට වයස අවුරුදු 23 කි. මා රාජ්‍ය සේවයෙහි යෙදී සිනටි කාලය තුලදීම මා දෙවියන්වහන්සේගේ සේවයෙහිද යෙදී සිටියෙමි.

මේ තුලින් මගේ ජීවිතයට ඉතා අභියෝගිමත් වූ අත්දැකීමක් ලැබුණි.

3 වන දවසේදී දිවා ආහාරයෙන් පසුව මෙම රැස්වීම් මාලාව අවසන් වූ විගස එකිනෙකා තම නිවෙස් කරා යන පිණිස බස් හා දුම්රියන් ලබා ගන්නා පිණිස ඉක්මනින් සූදානමින් පිටත් විය.

නමුත් මට එම ස්ථානයට යාමට නොහැකි විය. මන්ද ශුද්ධාත්මයාණන්වහන්සේ මා තුල ක්‍රියා කිරීමට පටන්ගත්තේය. මා එම ගේට්ටුව අසල පැයක් පමණ කාලයක් සිටගෙන සිටියෙමි. සහෝදර ස්ටැන්ඩ්ලි විසින් ඉගැන්වූ සෑම දේව වචනයක්ම මගේ ආත්මික ඇස් ඉදිරිපිටට පැමිණෙන්නට පටන්ගත්තේය. ශුද්ධාත්මයාණන්වහන්සේ උන්වහන්සේගේ නිශ්චලවූ හඬින් මට කථා කිරීමට පටන්ගත්තේය. එම නිසා මා නතරවූ ස්ථානයෙන් ඉදිරියට යාමට නොහැකිව සිටියෙමි. මා තාම්බරම් වේලච්චේරි නැමති ප්‍රධාන මාර්ගයෙහි ඇවිදීමට පටන්ගත්තේමි. එම මාර්ගයෙහි අධික උෂ්ණත්වයක් තිබුනේය. මා සමඟ සිටි තරුණ තරුණියන් සිතුවේ මට මුදල් නොමැති නිසා පයින්ම ගමන් කරනවා ඇතැයි කියාය. ඔවුන් මා දෙස දුකින් බලමින් ඔවුන් ගමන් කාවූ වාහනවල නැගී යන්න ගියෝය.

නමුත් මා කිසිදු කනස්සල්ලකට පත් වූයේ නැත. මා එම මාර්ගයෙහි පයින්ම ගමන් කරමින් මට මුණගැසුනු සෑම කෙනෙකුටම ශුභාරංචි පත්‍රිකා බෙදා දෙමින් ගමන් කලෙමි. එදා මා 12Km පමණ දුරක් පයින්ම ගමන් කලෙමි. මට මහත් කුසගින්නක් හා පිපාසයක් දැනුනි. බොහෝ දෙනෙක් මා දෙස දුකින් බලා සිටියේ මේ තරුණයා අධික අව් රශ්මිය ඇති වේලාවේදී පත්‍රිකා හා හා පොත් රැගෙන ඇවිදිමින් කරන්නේ මොනවාද කියාය. මෙලෙස මා පයින්ම වේච්චේරි නැමති ස්ථානයට පැමිණි විට මා අත තිබූ සියලුම පත්‍රිකා බෙදා අවසන් විය. එසේම ඒ අතට සෙනගගේ අඩුවක්ද තිබුණි.

මා ගියාවූ මෙම අමාරු තත්වය පිළිබඳව ස්වර්ගයෙන් ඇස් දෙකක් මා දෙස බලමින් සිටින බවත් බොහෝ ඇස් මා දෙස බලා සිටින බවත් මට හැඟුනි. මා ශාරීරික ලෙස බොහෝ වෙහෙසට පත්ව සිටි නමුත්

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR

We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

## PLEASE PRAY FOR OUR MINISTRIES AT THE HEAD QUARTERS

1. Prayer Service : 24 hours
2. **BIBLECOR** – Bible Correspondence Courses : English, Tamil & Hindi
3. **ECHO OF HIS CALL** – Monthly Magazines : English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press – Publications
11. St. Paul's Matriculation School – Village English High School
12. Sunday Schools : 8.30 a.m. & 4.00 p.m. Sunday
13. **Tamil Services : 8.00 a.m. & 10.00 a.m. Sunday**
14. **Hindi Service : 4.00 p.m. Sunday**
15. **Telugu Service : 5.00 p.m. Sunday**
16. **English & Tamil Service : 6.00 p.m. Sunday**
17. Women's Prayer : 5.30 p.m. Wednesday
18. Men's Prayer : 7.00 p.m. Friday
19. Discipleship Meeting : 6.00 p.m. Saturday
20. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
21. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
22. Ministers Review Meeting : 5.30 p.m. First Saturday
23. Parents' Prayer : 4.00 p.m. First Sunday
24. Night Prayer : 9.30 p.m. Second Friday
25. Fasting Prayer : 9:30 a.m. Third Saturday
26. Holy Communion : Second Sunday Services
27. Youth / Kid Prayer : 10.00 p.m. daily
28. Staff Devotion : 9.00 a.m. daily
29. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

ආත්මික ලෙස මා ශක්තිමක් විය. රෑ බෝව්ගෙන එන විටදී මා නැවති සිටි ස්ථානය වන චේපාක් චෙන්නෙයි වලට ආවෙමි. මෙය සිදුවී දවස් ගතවිය. වසර ගණනාවක් ගත විය. මා එදා ගමන් කලාවූ ස්ථාන වල සිටින බොහෝ ආත්මික මනුෂ්‍යයන් දෙවියන්වහන්සේ මට ලබා දුන්නේය. එසේම සහෝදර දුරෙයි සහ ඔහුගේ භාර්යාව වන සහෝදරී ෆෙනිලා සමඟ දෙවියන්වහන්සේ මට ඉතා හොඳ මිත්‍රත්වයක් ලබා දුන්නේය. 1997 වන වර්ෂයේදී දෙවියන්වහන්සේ මා හට සභාවක් ලබා දුන්නේය. තවත් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාසලක් (ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල) උන්වහන්සේ මට ලබා දුන්නේ සංතෝෂපුරම් යන ස්ථානයේදී එනම්, එදා මා වේලච්චේරි දක්වා පයින්ම ගමන් කලාවූ ස්ථානයේය. තවද මා ඇවිද්ද වෙලච්චේරි යන පාළාතෙහිම සභාවක්ද පූර්ණ කාලීන නෙහෙමියා බයිබල් විදුහලද ආරම්භ කිරීමට මාර්ගයක් විවෘත කලේය. සහෝදර එඩ්වින් යන තැනැත්තාට දෙවියන්වහන්සේ කථා කරමින් මෙම සේවය උදෙසා ඉඩමක් ලබා දෙන්නය කියා පැවසූ අතර ඔහු එය අපට ලබා දුන්නේය. අද අප මෙම ඉඩමෙහි සභාව හා නෙහෙමියා බයිබලු විදුහල පවත්වාගෙන යමු.

අපගේ සභාව සහ නෙහෙමියා බයිබල් විදුහල යන සේවා 2 ක කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ ඇස් දෙක වාගේය. දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මඟපෙන්වීමට අනුව මෙම අමාරු අත්දැකීම් තුළින් ගමන් කිරීමට උන්වහන්සේ මා හට උපකාර කලේය. මා ගමන්කලාවූ මාර්ගය ඉතා අමාරුයි. නමුත් එහි අවසානය බලවත් ජයග්‍රහනයකි.

ප්‍රිය සහෝදර සහෝදරිය, දෙවියන්වහන්සේ ඔබට මේ ආකාරයෙන් කථා කලාද? ඔබ දෙවියන්වහන්සේට ක්ෂණිකවම කීකරු වූවාද? ඔබ දෙවියන්වහන්සේගේ

RNI NO. TN/SIH/2006/17846

....Contd. from page 7

3). දෙවියන්වහන්සේගේ පොරොන්දු ප්‍රකාශ කිරීමට පටන්ගන්න. එය කටපාඩම් කර ප්‍රකාශ කරන්න.

*4). ස්වාමීන්වහන්සේ නුඹලා උදෙසා සටන් කරනසේක. නුඹලා නිශ්ශබ්දව සිටි යුතුයි. නික්මයාම 14:14*

ප්‍රිය මිත්‍රවරුනි,

කරුණාකර, ඔබට විශ්වාස කිරීමට හැකි මිනිසුන් ඔබ හා සමඟ ඇවිදින්නට හැකි මිනිසුන් පෙන්වන්නය කියා ස්වාමීන්වහන්සේට යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේගේ අභිමුඛත්වය තුළ නිශ්චලව සිටීමටත් උන්වහන්සේගෙන් ඉගෙන ගැනීමටත් කරුණාව ඉල්ලා යාච්ඤා කරන්න. ***යෙසායා 30:15*** හි මෙසේ පවසයි. ***''...හැරී නිශ්චලව සිටීම කරණකොටගෙන නුඹලා ගැලවෙන්නහුය, නොකැළඹී විශ්වාස කිරීමෙන් නුඹලාට බලය ලබන්නේය''*** කුමන දෙයක් සිදු වුවත් ඔබ වටා ඇති වතාවරනයන් කෙසේ වුවත් සර්වබලධාරී දෙවියන්වහන්සේව විශ්වාස කරන්න. උන්වහන්සේ සියලු රළු තැන් ඔබට සමතලා කර දෙයි.

## A good opportunity to get Echo of His Call monthly magazine at free of cost

If you could send the addresses of your friends / relatives through post, letter, e.mail, WhatsApp or phone to us, we will dispatch **Echo of His Call** monthly magazine to them at free of cost.

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 2nd MARCH 2024.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

*GOD BLESS YOU!*

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**